පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# දෙවන වාර පරීක්ෂණය - 2017

| ශ්‍රේණිය |
|---|
| 07 |

විෂයය **සිංහල භාෂාව හා සාහිත්‍යය -I,II**

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම/ඇතුළත්වීමේ අංකය : ..................................................
..................................................

කාලය : පැය **2** යි.

❖ **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

❖ **නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

❖ 1 හා 2 ප්‍රශ්නවල අක්ෂර වින්‍යාසය නිවැරදි ව ලියා ඇති වචනය තෝරන්න.

1. i) දර්ශණ ii) පිළිවෙළ iii) ලෙන්ගතු iv) අකණ්ඩ

2. i) කණිෂ්ඨ ii) නිශ්ඵල iii) විශිෂ්ට iv) නිස්ක්‍රිය

3. මහාප්‍රාණ අක්ෂරයක් යෙදී ඇති වචනය තෝරන්න.

   i) තෘෂ්ණාව ii) ප්‍රදානය iii) පිළිමය iv) ප්‍රභවය

4. මුල් පදයට සමානාර්ථයක් නොදෙන පදය වන්නේ,

   මුව -

   i) වත ii) මුහුණ iii) සවන iv) වුවන

5. මුල් පදයට විරුද්ධාර්ථයක් දෙන පදය වන්නේ,

   සරු -

   i) නිගරු ii) මසුරු iii) අසරු iv). නිසරු

6. මධ්‍යම පුරුෂ ඒක වචන නාම පදය තෝරන්න.

   i) මම ii) නුඹ iii) ඇය iv) ඔහු



EXAMRESULTS.LK

7. අනුක්ත බහුවචන පදය තෝරන්න,

i) රජවරු ii) ගොවියෝ iii) මිනිසුන් iv) ගුරුවරු

❖ **පහත සඳහන් වාක්‍යයේ හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.**

8. සියාතු මාමා කමත දෙසට ගමන් ....................................................

i) කළේ ය. ii) කළා ය. iii) කළ හ. iv) කළෝ ය.

❖ 9, 10 යන ප්‍රශ්නවල ඉරි ඇඳි පද කුමන ක්‍රියා පද වර්ගයට අයත්දැයි තෝරන්න.

9. හිවලා පැන්තකට **පැන** වේගයෙන් දුවන්නට විය.

i) අවසාන ක්‍රියා ii) විධි ක්‍රියා iii) පූර්ව ක්‍රියා iv) මිශ්‍ර ක්‍රියා

10. නංගි ගී **ගයමින්** රංගනයක යෙදුණා ය.

i) පූර්ව ක්‍රියා ii) අවසාන ක්‍රියා iii) විධි ක්‍රියා iv) මිශ්‍ර ක්‍රියා

❖ 11 , 12 යන ප්‍රශ්නවල දී ඇති අදහසට ගැළපෙන තනි පදය තෝරා ලියන්න.

11. නියම ස්වරූපය සැඟවී පවතින,

i) මුක්ත ii) ගුප්ත iii) සත්ත iv) නියුක්ත

12. රජුගේ ඇත්හල භාර ප්‍රධානියා .

i) ගජනායක ii) රාජනායක iii) ඇත්නායක iv) බලනායක

❖ **13, 14 හා 15 ප්‍රශ්නවල, දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.**

13. නො ලැබිය හැකි දෙයක් කෙරෙහි බලාපොරොත්තු තැබීම.

i) පරංගියා කෝට්ටේ ගියා වගෙයි.
ii) දියකාවගෙ පිටේ ලුණු හැංගුවා වගේ.
iii) ගඟට ඉනි කැපුවා වගේ.
iv) ඉබ්බාගෙන් පිහාටු ගන්නවා වගේ.

14. අරමුණ නොදැන යමක් කිරීම.

i) අබරා සිල් ගත්තා වගේ.
ii) කළුවා මාරපන් ගියා වගේ.
iii) කටුස්සාගේ කරේ රන් බැන්දා වගේ.
iv) හතර බීරි කතාව වගේ.

15. වැරදි හේතු මත නිගමනවලට එළඹීම.

i) අන්ධයා අලියාගේ හැටි කීවා වගේ.
ii) බල්ලගෙ වැඬේ බූරුවා කළා වගේ.
iii) බීරි අලින්ට වීණා ගායනා කරනවා වගේ.
iv) ගමරාල දිව්‍ය ලෝකේ ගියා වගේ.

❖ **16 හා 17 යන ප්‍රශ්නවල හිස්තැනට සුදුසු උක්ත පදය තෝරන්න.**

16. ........................................... ගසින් ගසට පැන අඹ කෑවෝ ය.

i) වඳුරන් ii) වඳුරා iii) වඳුරෝ iv) වැදිරිය

17. ............................................... දුම්රිය පොළට ගියා ය.

i) පියාණන් ii) පියා iii) මව iv) මැණියන්

18. අතීත කාලයට අයත් වාක්‍යය තෝරන්න.
i) වෛද්‍යවරයා ලෙඩුන් සුවපත් කරයි.
ii) කම්මල්කරුවෝ ආයුධ තැනුවෝ ය.
iii) ගායිකාව මිහිරි හඬින් ගී ගයයි.
iv)ලේඛකයෝ පොත් ලියති.

19. වර්තමාන කාලයට අයත් වාක්‍යය තෝරන්න.

i) අම්මා උදෑසනින් අවදි වූවා ය.
ii) ළමයි ක්‍රීඩා පිටියේ සෙල්ලම් කළෝ ය.
iii) අපි නිදහස උදෙසා සටන් කළෙමු.
iv) මම මිහිරි හඬින් ගී ගයමි.

20. නිවැරදි වාක්‍යය තෝරන්න.

i) තාත්තා රූපවාහිනිය නරඹයි.
ii) මා බුදුන් වැන්දෙමි.
iii) මිනිසුන් කුඹුරේ වැඩ කරති.
iv) අම්මා පුතුට ඔවදන් දුන්නේ ය.

(ලකුණු 2X20 =40)

II කොටස

❖ **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150 කට නො අඩු රචනයක් ලියන්න.

i) වන සම්පත සුරකිමු.
ii) අපි වෙමු හොඳ දරුවෝ.
iii) පොතපත කියවමු දැනුම වඩමු.
iv) මා කැමති ජාතික වීරයා. (ලකුණු 20)

02. පහත සඳහන් පාඨ

i) උපුටා ගත් පාඩම,
ii) කවුරුන් විසින්,
iii) කාහට කියන ලද්දක් ද? යන්න සඳහන් කරන්න.

1. "ඇයි මැණියනි, මම කුමන අන්‍යායක් කෙළෙම් ද?"

2. "මොන දිවිල්ලක් ද, කෑ නොගහා ඉන්නවා "

3. "පුතේ මේ සේරම අපේ චාරිත්‍ර, පාවර ආරක්ෂා කරන්නටයි මේ සිරිත් කරන්නේ"

4. "අන්න! අන්න! සර් එනවා. අපිත් යං කෝච්චිය ළඟට".

5. "මං ලොකු වුණා ම ටිකට් එකතු කරන කෙනෙක් වෙනවා" (ලකුණු 15)

03. පහත සඳහන් පද්‍ය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දෙව් පුර මෙන් දෙවියන් නේ
සිරිලක් දිව බබළන් නේ
එහි සක් දෙව් රජු මෙන් නේ
මගේ පුතා ලොකු වෙන් නේ

සිරි මහ බෝ සිඹිමින් නේ
මහ මෙව්නා පෙදෙසින් නේ
සුළං දැලක් මේ එන් නේ
මුට සිව රජු සිහිවෙන් නේ

i) දෙව් පුරය මෙන් බබළන්නේ කුමක් ද?

ii) පුතා උපමා කර ඇත්තේ කා හට ද?

iii) සුළං දැලක් එන්නේ කොහේ සිට ද?

iv) කවියේ සඳහන් බෞද්ධ සිද්ධස්ථානයේ නම ලියන්න.

v) දෙව් පුර, රජු යන පදවලට සමාන පදය බැගින් ලියන්න.

(ලකුණු 10)

04. අ/නාමල්ගම විද්‍යාලයේ විද්‍යාගාරය අබලන් තත්ත්වයක පවතින බැවින් එම විද්‍යාගාර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ඉල්ලමින් පළාත් ප්‍රධාන ඇමතිතුමාට යැවීමට සුදුසු රාජකාරී ලිපිය ලියන්න. (පාසල් සංවර්ධන සමිතියේ ලේකම් ඔබ යැයි සිතන්න)

නැතහොත්,

අ/රුවන්පුර තිස්ස මහා විද්‍යාලයේ ත්‍යාග ප්‍රදානෝත්සවය 2017 අගෝස්තු මස 03 වන දින පෙ.ව 10.00 ට විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වේ.එම අවස්ථාවට සහභාගි වන ලෙස දන්වමින් දෙමාපියන් වෙත යැවීමට සුදුසු ආරාධනා පත්‍රය සකස් කරන්න.

(ලකුණු 15)